# 14
# සඟරුවන වෙනුවෙන් ඉටුකරමු යුතුකම්

පසුගිය පොසොන් පෝ දින අප විද්‍යාලයේ ශීල සමාදන වැඩසටහනට, ආරාධිත ගිහි දේශක භවතකුගේ දේශනයක් ද ඇතුළත් ව තිබිණ. ඒ සඳහා පැමිණියේ විශ්‍රාම ලත් විදුහල්පතිවරයකු වූ විජිත මහතායි. විදුහල්පතිතුමාගේ ආරාධනාවෙන් එතුමාගේ දෙසුම ආරම්භ වූයේ කවියකිනි.

| | |
|---|---|
| තමන් පද | වන්දන |
| කළ පමණකින් | නන්දන |
| නිවන් සැප | වින්දන |
| වඳිමි මහ සඟන මුනි | නන්දන |

"බෝසත් දුවේ, පුතේ,

අද බොහොම හොඳ දවසක්. මේ දරුවෝ කියන්න බලන්න ඇයි, මේ පොහෝ දිනය අපට වැදගත් වෙන්නෙ කියල"

"අවසරයි, අද වගේ දිනයකයි අපට බුදු දහම ලැබුණේ." **භාෂිණී**, පිළිතුරු දුන්නා ය.

පුබුදු අත ඔසවා මෙසේ කිව්වේ ය. " මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස වැඩම කළේ අද වගේ දිනයක."

"පිළිතුරු දෙක ම බොහොම හොඳයි. අපට බුදු දහම විතරක් නො වෙයි. ඒ එක්ක ම තවත් බොහෝ දේ ලැබුණා. මෙරට දේශීය භික්ෂු පරපුරක් ඇති වීම ඒ අතර වැදගත් ම කරුණක්. මම අද මේ දරුවන්ට කියා දෙන්නේ, අපි අපේ ඒ දේශීය භික්ෂු පරපුරත් ඇතුළත් වන මහා සංඝරත්නය රැක ගන්නේ කෙසේ ද? උන් වහන්සේලාට අපගෙන් ඉටුවියයුතු දේ මොනවා ද? ඇයි අප උන්වහන්සේලාට පුදසත්කාර කළ යුත්තේ? ආදී කරුණු පිළිබඳවයි."

"බෞද්ධයන් වන අපට ඉතා වැදගත් රත්න තුනක් තියෙනවා. මෙතැන ඉන්න

කාට හරි කියන්න පුළුවන් ද ඒ රත්න තුන?"

ඉදිරියේ අසුන් ගෙන සිටි **උත්පලා** "අවසරයි, බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය නේ" දැයි ඇසුවා ය.

"බොහොම හොඳයි. අද අප කතා කරන්නේ ඒ තුන්වන රත්නය, සංඝරත්නය ගැනයි. මා මුලින් කිව්ව කවිය, වෑත්තෑවේ හාමුදුරුවන්ගේ ගුත්තිල කාව්‍යයේ සඳහන් වෙන එකක්. ඒකෙන් කියන්නෙත් අපේ මහාසංඝරත්නය ගැනයි. 'දෙපා වැන්ද පමණකින් බොහෝ දෙනාට නිවන් සුවය ලබා දෙන බුද්ධ පුත්‍රයන් වන මහසඟරුවන වන්දනා කරමි' යන්න එහි තේරුමයි.

මේ දරුවො පාසලේ දි, දහම් පාසලේ දි බුදු රජාණන් වහන්සේගේ මුල් ම ශ්‍රාවකයන් වහන්සේලා ගැන ඉගෙන ගෙන තියෙනවා. අපි ඒ පිරිසට කියන්නේ පස්වග භික්ෂූන් වහන්සේලා කියලා. ඒ අදට අවුරුදු 2600කට කලින්. එද බුදුරජාණන් වහන්සේ ආරම්භ කළ සංඝ සමාජය අද දක්වා ම පැවතගෙන එනවා, නොයෙක් සන්ධිස්ථාන පසු කරගෙන, නොයෙක් අතින් ලෝකයට සෙත සදමින්. සඟරුවන මහ පින් කෙතක්. එයින් ලෝකයාට ලැබෙන අස්වැන්න පුංචි නෑ. මේ අතර ශ්‍රී ලංකාවේ ථෙරවාද මහ සඟරුවන සුවිශේෂයි. මේ දරුවො ඒ ගැන 8 වන ශ්‍රේණියේ දී ඉගෙන ගත්තා. ඒ සුපිළිපන් මහාසංඝරත්නය තමයි, තථාගතයන් වහන්සේ දේශනා කළ නිර්මල බුදු දහම, එද සිට අද දක්වා ම ආරක්ෂා කරගෙන එන්නේ. සියලු රටවල, බුදු දහම දේශනා කිරීමට, පුංචි හාමුදුරුවන් වහන්සේගේ පටන්, වැඩිහිටි හාමුදුරුවන් වහන්සේලා දක්වා දායක වෙලා තියෙනවා. තවත් බොහෝ සමාජ සංස්කෘතික සේවාවන්ට උන් වහන්සේලා එද පටන් කැප වුනා.

ඔබ, මීට පෙර පාඩම්වල දී සගාලෝවාද සූත්‍රයේ එන ඇතැම් කරුණු ඉගෙන ගත්තා. සදිසා සංග්‍රහය එහි ඇතුළත් වැදගත් ඉගැන්වීමක්. එයින් පෙන්වා දෙන්නේ සමාජයක ඒ ඒ කොටස් එකිනෙකාගේ යුතුකම් ඉටු කරමින් දැහැමි සබඳතාවක් පවත්වා ගෙන යා යුතු ආකාරයයි.

අද මා කතා කරන්නේ මුලින් කී සංඝරත්නය සමග ගිහියා සබඳතා පැවැත්විය යුතු ආකාරය ගැනයි. "අවසරයි, දේශකතුමනි, සදිසා නමස්කාරය ගැන කථා කරන කොට අපේ ස්වාමීන් වහන්සේලා උඩ දිසාව වශයෙන් නේද පෙන්නුම් කළේ ?" එසේ ඇසුවේ **නුවනී** ශිෂ්‍යාව ය. "ඔව්, ඔව්, බොහොම හරි. සූත්‍රයේ සඳහන් වෙන්නේ "උද්ධං සමණබ්‍රාහ්මණා" කියලා. එහෙම උගන්වන්නේ උන් වහන්සේලා සිවුවණක් පිරිසේ උතුම් ම පිරිස වන නිසා; පරම පූජනීය වන නිසා.

දැන් අපි සාකච්ඡා කරමු, කොහොම ද අපේ මහාසංඝරත්නයට ගිහියන් වන අපි යුතුකම් ඉටු කරන්නේ කියලා. තථාගතයන් වහන්සේ දේශනා කළේ කරුණු පහකින් ගිහියන් සඟරුවනට සංග්‍රහ කළ යුතු බවයි. ඒ කරුණු පස මෙහෙමයි.

1. මෛත්‍රී සහගත කාය කර්මයෙන්
2. මෛත්‍රී සහගත වාක් කර්මයෙන්
3. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්
4. ගේ දෙර සඟරුවනට විවෘත ව තැබීමෙන්
5. සිවු පසයෙන් උපස්ථාන කිරීමෙන්

අපේ මහසඟරුවන ජාතික සම්පතක්. ඒ සම්පත ආරක්ෂා කර ගැනීම අප කාගේත් යුතුකමක්. අතීතයේ සිට ම රට, ජාතිය, ආගම වෙනුවෙන් අපේ මහාසංඝරත්නය වැඩ කළා. සමහර විට ජීවිතය පවා කැප කරලා තියෙනවා. උන් වහන්සේලා අද වගේ ම ඉදිරියටත් මේ කාර්යය පවත්වා ගෙන යාවි. මේ නිසා ගිහියන් වන අපි අපේ මහාසංඝරත්නයට යුතුකම් ඉටු කළහොත්, උන් වහන්සේලාගේ ඒ කාර්යය කරගෙන යැමට මහත් ශක්තියක් වේවි.

දරුවනේ, බොහොම මෙත් සිතින්, දැඩි හිතවත්කමින් යුතු ව ස්වාමීන් වහන්සේට සංග්‍රහ කරන්න සලකන්න ඕනෑ. මහාසංඝරත්නය ජීවිත පවත්වා ගන්නේ, අප පිරිනමන **සිවුපසයෙන්**. ඒ නිසා මෙත් සිත් පෙරටු කරගෙන අපේ කය, වචනය, මනස යන තිදෙර වෙහෙසවා යම් යම් යුතුකම් ඉටු කරනවා නම්, අපත් උන් වහන්සේලාගේ මෙහෙයට උදව් වූ පිරිසක් බවට පත් වෙනවා. දනමාන පූජා කළ යුත්තේ බලවත් කැමැත්තෙන්. උන් වහන්සේලාට යමක් පූජා කරලා, අප යමක් බලාපොරොත්තු වෙන්න හොඳ නෑ. ඔබටත් පුළුවනි, මෙත් සිතින් ස්වාමීන් වහන්සේට මාර්ගය ඉඩ දෙන්න, බසයේ අසුනක් ලබා දෙන්න. වැඳුම් පිදුම් පවා මෛත්‍රී සහගත ව ම කරන්න. ඒවා මෛත්‍රී සහගත කාය කර්මයි.

යහපත් වචනයෙන් කතා කරන එකත් ඉතා ම වැදගත් යුතුකමක්. මෙත් සිතින් ස්වාමීන් වහන්සේලාගේ සුවදුක් විමසීම, අවශ්‍යතා ගැන විමසා බැලීම, ප්‍රියශීලී වචනවලින් ඇමතීම ආදිය මෛත්‍රී සහගත වචී කර්මයි. අපේ හාමුදුරුවන් වහන්සේ, ස්වාමීන් වහන්සේ ආදී වශයෙන් උන් වහන්සේලා අමතන්න හුරු වෙන්න ඕනෑ. මොක ද සමහර වැඩිහිටියන් පවා අද උන්වහන්සේලාට 'සාධු' කියන නාමය භාවිත කරනවා. එය ගැළපෙන්නේ නෑ.

ද්වේෂයෙන්, ක්‍රෝධයෙන් යුතු සිතින් ස්වාමීන් වහන්සේ දෙස බලන්න හොඳ නෑ. එය පාප කර්මයක් වෙනවා. මෛත්‍රියෙන් කරුණාවෙන් යුක්ත ව උන් වහන්සේලාට දැතින් සංග්‍රහ කිරීම, ප්‍රිය මනාප වචනයෙන් යටහත් ව කතා බස් කිරීම වගේ ම උන්වහන්සේලා ගැන මෛත්‍රී සහගත ව සිතීමයි අපේ යුතුකම. බෞද්ධයන්ගේ මුර දේවතාවන් යන අපර නාමයෙන් උන්වහන්සේලා හඳුන්වනවා. සසුනේ ප්‍රධාන ආරක්ෂකයන් වන්නෙත් උන් වහන්සේලායි. ශාසනයේ පැවැත්මට ජීවිතය කැප කර සිටින සඟරුවනට අපට හැකි ආකාරයට උදව් කරන්න පුළුවන්. අපේ නිවසකට ස්වාමීන්

වහන්සේ නමක් වැඩමවීම මහා භාග්‍යයක් සේ සලකනවා. තමන්ගේ නිවසට වැඩම කළ පසු ආසනයක් පිළියෙල කර දීම, දනයට සුදුසු වේලාවක නම් දන් පිළිගැන්වීම, දූහැත් ගිලන්පස පිළිගැන්වීම කළ යුතුයි. සුවදුක් විචාරීමත්, තොරතුරු ඇසීමත් යුතුකමක්. ශාසනික අවශ්‍යතා සඳහා අපේ නිවසේ දොර නිතර ම පාහේ උන් වහන්සේලාට විවෘත ව තැබිය යුතු යැයි කියන්නේ ඒකයි.

අපේ රටට බුදු දහම ලැබිලා වසර 2300කටත් වැඩියි. බුදුරජාණන් වහන්සේ පහළ වෙලා අවුරුදු 2600කට ආසන්නයි. මේ කාල සීමාව තුළ දයකයන්ගේ ද උපකාර ඇති ව බුදු සසුන ආරක්ෂා කර ගත්තේ අපේ මහාසංඝරත්නයයි. ඒ නිසා ඉදිරියටත් ස්වාමීන් වහන්සේලා ආරක්ෂා කර ගැනීම උන් වහන්සේලාට අනුග්‍රහ දක්වීම අපේ යුතුකමක්. ඒ සඳහා තමයි උන් වහන්සේලාට අප සිවුපසයෙන් උපස්ථාන කළ යුත්තේ. අපේ මහාසංඝරත්නය නැත්නම්, අපට බුදු දහමක් නෑ. කොතරම් වෙහෙර විහාර, බුද්ධ ප්‍රතිමා වහන්සේ, බෝධීන් වහන්සේ තිබුණත් බුදු දහම ආරක්ෂා වෙන්නේ නෑ. බුදු දහම පවතින්නෙත් නෑ.

"දේශකතුමනි, අවසරයි, අපේ ස්වාමීන් වහන්සේගෙන් අපට ලැබෙන අනුග්‍රහ ගැනත් බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා නේ ද?

"බොහොම හොඳ ප්‍රශ්නයක්. මහසගරුවන අපට කරුණු හයකින් සංග්‍රහ කරන බව සිඟාලෝවාද සූත්‍රයේ පැහැදිලි කර තිබෙනවා. බුදුරජාණන් වහන්සේ මහා සංඝරත්නයට දේශනා කළේ නිතර දනාදී ආමිසයෙන් සංග්‍රහ කරන ගිහි දයකයන්ට ධර්ම දනයෙන් සංග්‍රහ කරන ලෙසයි."

අපේ හාමුදුරුවන් වහන්සේලා

1. අප පාප කර්මවලින් වළක්වා ගන්නවා
2. යහපත් කුසල කර්මවල යොදවනවා
3. මෙත් සිතින් අනුකම්පා කරනවා
4. අසා නැති දහම් කරුණු කියා දෙනවා
5. අසා ඇති දහම් කරුණු ඉතා හොඳින් තේරුම් කර දෙනවා
6. සුගතිගාමී වන මග කියා දෙනවා

"දරුවනේ, මහසගරුවන පව්කම්වලින්, සසර දුක් ඇති කරන වරදින් අප මුදවා ගැනීමට අවශ්‍ය අනුශාසනා කරනවා. පව්කම්වල දුක් විපාක අපට කියා දෙනවා. ඒවායින් වළක්වා ගන්නවා. ඒ වගේ ම හොඳ කටයුතුවල කුසල කර්මවල අප යොදවනවා. ඒවායේ ආනිසංස අපට කියා දෙනවා. අනුකම්පා පෙරදැරි ව ගිහි දයකයන් වන අපේ දුකේදීත් සැපේදීත් උන් වහන්සේලා අප සමග සිටිනවා, උපතේ සිට මරණය දක්වා ම. ධර්ම දේශනා, පිරිත් දේශනා, බෝධි පූජා ආදිය පවත්වා කරන ආශීර්වාද කොතරම්

වටිනවා ද? මේ සියල්ල උන් වහන්සේලා කිසි ම ලාභයක් අපේක්ෂාවෙන් තොරවයි සිදු කරන්නේ.

අපේ සඟරුවන තථාගත ධර්මය දේශනා කරමින් අපේ ජීවිත සකස් කර ගැනීමට, දියුණු කර ගැනීමට අවශ්‍ය කරුණු පෙන්වා දෙනවා. ඒ වගේ ම පරලොව ජීවිතය, සැපවත් කර ගැනීමට අවශ්‍ය කාරණා පෙන්වා දෙනවා. විහාරස්ථානවල දහම් පාසල් තුළින් සිදු වෙන්නේ කොයිතරම් වටිනා සේවයක් ද? දහම් දැනුම ලබා ගැනීමට පමණක් නො වේ, හොඳ ආකල්ප ඇති කර ගැනීමට, ගුණ යහපත්කම දියුණු කර ගන්නට දක්ෂතා, කුසලතා වර්ධනය කර ගන්නට මහාසංඝරත්නයෙන් ලැබෙන මගපෙන්වීම මොන තරම් වටිනවා ද? ඔබට පාසල් සිසුන් වශයෙන්, උන් වහන්සේලාට යම් ආකාරයකින් උදව් විය හැකියි. ඒ වගේ ම ඔබේ දෙමාපියන්ට, අනෙක් වැඩිහිටියන්ට ඊට වඩා උපකාර කරන්න පුළුවන්.

අපේ මහසඟරුවන හුදෙකලා පිරිසක් නො වෙයි. අපේම ගම්වල උපන් දරුවෝ, ගිහි ජීවිතයෙන් ඈත් වෙලා විශාල සමාජ සේවයක් කරන අපේම පිරිසක්.

අතීතයේ සිට ම රාජ්‍ය පාලකයන්, සාමාන්‍ය ජනයා අපේ මහසඟරුවන සමග සමීප සබඳතා පවත්වා ගත් බවට සාධක තියෙනවා. එයින් තම ජීවිත දියුණු කර ගෙන තියෙනවා. මේ නිසා කුඩා අවදියේ සිට අප හැම දෙනා ම අපේ මහසඟරුවන ආරක්ෂා කරගන්නත්, නිතර පන්සල ඇසුරු කරන්න සහ අවවාද අනුශාසනා ලබා ගන්නත් බොහොම කැමැත්තෙන් ඉදිරිපත් වෙන්න ඕනෑ."

**සාරාංශය**

අතීතයේ සිට ම මහාසංඝරත්නය ගිහි පිරිස සමග සමීප සබඳතා පවත්වා ඇත. රජවරුන්, සිටුවරුන් පමණක් නොව සාමාන්‍ය ජනයා ද මහසඟරුවන සමග කටයුතු කරමින් ඔවුන්ගේ දෙලොව ජීවිත සාර්ථක කර ගත් බව පෙනේ. ගිහි පැවිදි සබඳතා තර කර ගැනීමෙන් ඇති වූ යහපත් ප්‍රතිඵල රාශියකි. විශේෂයෙන් මහාසංඝරත්නයේ ඇසුර නිසා ගිහි පිරිස යහ මගට යොමු වීමෙන් සමාජයට සෙත සැලසිණි.

## ක්‍රියාකාරකම්

01. භික්ෂූන් වහන්සේගෙන් අපට සිදුවන සේවාවන් 5ක් ලියන්න.

02. ගිහියන් විසින් භික්ෂූන් වහන්සේට ඉටු කළ යුතු යුතුකම් මොනවා ද?

03. අප භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කරගත යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න.

## පැවරුම

පන්සල ගැන, භික්ෂූන් වහන්සේලා ගැන හොඳ හැඟීම් ඇති වන ගීත එකතු කර කුඩා පොතක් පිළියෙල කරන්න.

## පුහුණුවට

සම්බුදු හිමියන් දෙසා
ඇත සමණන් උඩ දිසා
මෙත් සිත් කය හා වචනය
පතුරා ඉන්නට සිතනුය
නොයෙමු දෙර වසා
පුදමු සිවු පසා

සම්බුදු හිමියන් දෙසා
ඇති සිය යුතුකම් ලෙසා
වළකා පව පින යොදනුය
සලකා වැඩ දම් දෙසනුය
කියමු සැක නසා
නිවන් යන ලෙසා